දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය

கல்வி அமைச்சு

**Ministry of Education**

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
'இசுருபாய' ஸ்ரீ ஜயவர்தனபுர
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

මගේ අංකය / எனது இல. / My No.: ED/1/9/1/1/4

ඔබේ අංකය / உமது இல. / Your No.: ..............................

දිනය / திகதி / Date: 2013. 03.27

**චක්‍රලේඛ අංක :13 /2013**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය හා සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

**<u>මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුව අනාගත ශ්‍රී ලංකාවේ දැනුම කේන්ද්‍රීය සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගනු වස් ප්‍රාථමික පාසල් පන්දහසක් ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන - දෙවන අදියර</u>**

**<u>(2013.04.05 - 2013.06.05)</u>**

ජීවිතයේ අභියෝගවලට සාර්ථකව මුහුණ දියහැකි වන පරිදි දරුවන්ගේ පෞරුෂ සංවර්ධනය සඳහා ශක්තිමත් පදනමක් සකස් කිරීම ප්‍රාථමික අධ්‍යාපනයේ මූලික ඉලක්කය වේ. එම ඉලක්කය සාක්ෂාත් "කරගැනීම සඳහා ද්විතීයික පාසල් දහසට සමගාමීව සංවර්ධනය කෙරෙන ප්‍රාථමික පාසල් ජාලය "ළමා මිතුරු පාසල්" ලෙස සංවර්ධනය කිරීම සඳහා මාන හයකින් සමන්විත වූ ආකෘතියක් හඳුනාගෙන ඇත. ළමා මිතුරු පාසල් වැඩසටහනේ මූලික පදනම ලෙස සිසුන්ට ප්‍රියජනක වූ සෞඛ්‍යවත් හා ආරක්ෂාකාරී පාසල් පරිසරයක් සකස් කිරීම අවශ්‍ය වේ. ඒ සඳහා එක් පියවරක් වශයෙන් තෝරාගනු ලබන පාසල්වල භෞතික පහසුකම් ප්‍රවර්ධනය කිරීමට එක් පාසලකට රුපියල් 500,000 බැගින් ලබාදීමට අපේක්ෂා කෙරේ.

02.. එහි පළමු අදියර ලෙස 2012 වර්ෂයේ දී ප්‍රාථමික පාසල් 1680ක මූලික භෞතික පහසුකම් ප්‍රවර්ධනය සිදුකරන ලදී. 2013 වර්ෂයේ දී එහි දෙවන අදියර යටතේ තවත් ප්‍රාථමික පාසල් 3,320ක යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂිතය. මෙම වැඩසටහන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රමුඛ දායකත්වය මත 2013.04.05 වන දින සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ , පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු හා කලාප අධ්‍යාපන කාර්යාලවල පූර්ණ දායකත්වයෙන් හා දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ මග පෙන්වීම යටතේ මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

03. මෙම වැඩසටහන කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් **2013.04.05 -2013.06.05** දින දක්වා මාස දෙකක කාලයක් ප්‍රාථමික පාසල් සංවර්ධනය සඳහා යොදාගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර ඇත. එම කාලය තුළ මෙම පාසල්වල යටිතල පහසුකම්වල මූලික සංවර්ධන කටයුතු සියල්ලම අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. විදුහල්පතිගේ පූර්ණ කාලීන කැපවීම හා සියලුම සම්පත්දායකයින්ගේ පූර්ණ සහභාගීත්වය තුළින් මෙම අරමුණු සපුරාගැනීමට ක්‍රියාකළ යුතු වේ.

04. මෙම වැඩසටහන යටතේ ප්‍රාථමික පාසල්වල සංවර්ධනය කළ යුතු මූලික ක්‍රියාකාරකම් 10ක් පහත දක්වා ඇත.

1. විදුලිබල පහසුකම් සැපයීම
2. පානීය ජලය සැපයීම
3. වැසිකිළි හා සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය
4. පාසල් වැට හා ගේට්ටු සකස් කිරීම
5. පවතින ගොඩනැගිලි අලුත්වැඩියා කර තීන්ත ආලේප කිරීම
6. පාසලේ නාම පුවරුව සකස් කිරීම
7. ප්‍රාථමික අංශයේ සිසුන් සඳහා ක්‍රියාකාරකම් කාමරය විධිමත් පරිදි සකස් කිරීම
8. සෙල්ලම් මිදුල විධිමත් ලෙස සකස් කිරීම
9. පාසල් භූමිය ආදර්ශවත් ගෙවත්තක් බවට පත්කිරීම
10. ගුරුවරුන් දැනටමත් පදිංචි ගුරු නිවාසයක් ඇත්නම් එහි අත්‍යවශ්‍ය අලුත්වැඩියාවන් පමණක් සිදුකිරීම.

05. සමහර පාසල්වල ඉහත සඳහන් ක්‍රියාකාරකම් නිමකර ඇත්නම් මීට අමතරව අත්‍යවශ්‍ය යයි පාසල හඳුනා ගෙන ඇති වෙනත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ හැකි වේ.

06. 2013 වර්ෂයේ පළමු පාසල් වාරය අවසන් වන 2013.04.05 වන දින විදුහල්පති විසින් ආචාර්ය මණ්ඩලය සමග දෙමාපියන්,සුභසාධකයන්,ප්‍රජා සංවිධාන,ආදී ශිෂ්‍යයන් ඇතුළු පාසල් ප්‍රජාව පාසලට කැඳවා මෙම සංවර්ධන වැඩසටහන් පිළිබඳ දැනුවත් කිරීම සිදු කළ යුතුය. වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් මේ සමග අමුණා ඇති අතර එය පාසලට ගැළපෙන ලෙස සකස් කර එම කාලරාමුව තුළ මෙකී කාර්යයන් ඉටු කිරීම සඳහා ඔබගේ දැඩි අවධානය යොමු කරවමි.

07. මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂකගේ වගකීම යටතේ ප්‍රාථමික අධ්‍යාපන ගුරු උපදේශකවරුන් පාසල්වලට යෙදවිය යුතුය.ඒ සඳහා ඔවුන්ට පාසල් නම් කර දී වගකීම් පැවරීම අවශ්‍ය වේ. පාසල්වල මෙම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන්ගේ උපරිම දායකත්වය ලබාදීම අනිවාර්ය වේ.

08. අදාළ කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් විසින් පාසලේ සංවර්ධන කටයුතු සඳහා යොමු කරන විවිධ පාර්ශවයන් හා ආයතන ප්‍රධානීන්ගේ සහයෝගය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු විදුහල්පති විසින් සම්පාදනය කළ යුතුය. ශ්‍රී ලංකාවේ පාසල් දරුවන් සඳහා අංග සම්පූර්ණ ප්‍රාථමික අධ්‍යාපනයක් තහවුරු කිරීමේ මූලික පියවරක් ලෙස ජාතික ප්‍රතිමානවලට අනුව පහසුකම්වලින් සමන්විත ප්‍රාථමික පාසල් පද්ධතියක් ප්‍රතිනිර්මාණය කිරීම මෙහි මූලික හරයයි. ඒ අනුව ක්‍රියාත්මක කෙරෙන මෙම වැඩසටහන සාර්ථක කර ගැනීමට තම පාසලේ ආචාර්ය මණ්ඩලය,පාසලේ සංවර්ධන සමිතිය ඇතුළු පාසල් ප්‍රජාව සමග උපරිම සහයෝගය ලබාදීමට කටයුතු කිරීම විදුහල්පතිගේ වගකීම වේ.

09. ලබා දී ඇති කාලරාමුවට අනුකූලව සෑම සතියකට වරක් කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් තම කොට්ඨාසයේ සංවර්ධනය කෙරෙන පාසල් පිළිබඳව ප්‍රගති වාර්තාවක් අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලබා දිය යුතුය. එහි පිටපතක් පළාතේ ප්‍රාථමික අධ්‍යාපන නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත හා අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාථමික අධ්‍යාපන ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කිරීම අනිවාර්ය වේ.

10. තවදුරටත් අවශ්‍ය මගපෙන්වීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් චන්ද්‍රා වික්‍රමසිංහ මහත්මිය (දුරකථන අංක 0714443038) හා අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් එස්.යූ විජේරත්න මහතා (දුරකථන අංක 0779633322) ඇමතිය හැකි අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ මෙහෙයුම් මැදිරියේ අංක 1988 ඇමතීමෙන් ද විස්තර ලබා ගත හැකිය.

මෙම ජාතික සංවර්ධන වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

එස්.එම්.ගෝඨාභය ජයරත්න
අධ්‍යාපන ලේකම්

පිටපත්-

1. ලේකම් - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.පි.
2. චන්ද්‍රා වික්‍රමසිංහ මිය - අතිරේක ලේකම් (ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය) - කරු. දැ.ගැ.පි.
3. එස්.යූ විජේරත්න මහතා - අතිරේක ලේකම් (අධ්‍යාපන අමාත්‍යාංශය) - කරු. දැ.ගැ.පි.
4. සියලු ම දිස්ත්‍රික් ලේකම්වරුන් - කරු. දැ.ගැ.පි.

ඇමුණුම

**2013.04.05 - 2013.06.05 දක්වා මාස දෙකක කාලය තුළ ප්‍රාථමික පාසල්වල යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම සඳහා ක්‍රියාත්මක කළ යුතු දළ වැඩසටහන**

| දිනය | කාර්යය | සහභාගීත්වය | වගකීම | වාර්තා කළ යුතු නිලධාරියා |
|---|---|---|---|---|
| 2013.04.05 | • ප්‍රාථමික පාසල්වල යටිතල පහසුකම් සම්පූර්ණ කිරීමේ වැඩසටහන හා සංවර්ධන මාස දෙක පිළිබඳව පාසල් ප්‍රජාව දැනුවත් කිරීමේ උත්සවය හා වැඩසටහන ආරම්භය | ප්‍රාදේශීය දේශපාලන අධිකාරිය, සිසුන්, ගුරුවරුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යයන් , සුභ පතන්නන් ඇතුළු පාසල් ප්‍රජාව | විදුහල්පති | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත |
| 2013.04.05-2013.04.14 | • සහභාගීත්ව ප්‍රවේශය අනුගමනය කරමින් පාසලේ පවතින තත්ත්වය නිශ්චය කර ගැනීම හා සංවර්ධනය කළ යුතු යටිතල පහසුකම් හඳුනා ගැනීම හා ප්‍රමුඛතා ලේඛන සකස් කිරීම ( ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර තත්ත්වය ඡායාරූප ගත කිරීම අවශ්‍ය වේ. | සිසුන්,ගුරුවරුන්,දෙමාපියන්, ආදි ශිෂ්‍යයන් , සුභ පතන්නන් ඇතුළු පාසල් ප්‍රජාව හා ප්‍රාථමික අධ්‍යාපන ගුරු උපදේශක | විදුහල්පති | කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත |
| | • එක් එක් සංවර්ධන වැඩසටහ වෙනුවෙන් වගකීම පැවරෙන පාසල් ප්‍රජා කණ්ඩායම් තෝරා ගැනීම. | සිසුන්, ගුරුවරුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යයන් , සුභ පතන්නන් ඇතුළු පාසල් ප්‍රජාව හා විද්‍යාපීඨ ආචාර්යවරුන් , ගුරු සිසුන් හා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ හා ප්‍රාථමික අධ්‍යාපන ගුරු උපදේශකවරුන් | විදුහල්පති | ප්‍රාදේශීය ලේකම් හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත |
| 2013.04.15-2013.04.28 | • හඳුනාගත් එක් එක් කාර්යයන් සඳහා වෙන වෙනම පිරිවිතරයන් හා ඇස්තමේන්තු සකස් කිරීම. | සිසුන්, ගුරුවරුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යයන් , සුභ පතන්නන් ඇතුළු පාසල් ප්‍රජාව හා විද්‍යාපීඨ ආචාර්යවරුන් හා ගුරු සිසුන් හා ප්‍රාථමික අධ්‍යාපන ගුරු උපදේශක හා ඉංජිනේරුවරුන් හා කාර්මික නිලධාරීන් | විදුහල්පති, පාසල් සංවර්ධන සමිතිය හා ඉංජිනේරුවරුන් හා කාර්මික නිලධාරීන් | ප්‍රාදේශීය ලේකම් හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත |
| | • පාසලේ ක්‍රියාත්මක කිරීමට හඳුනාගත් එක් එක් කාර්යය සඳහා පාසල් සංවර්ධන සමිතිය හා ප්‍රාදේශීය ලේකම් අතර ගිවිසුම් සකස් කිරීම හා අනුමැතිය ලබා ගැනීම. | පාසල් සංවර්ධන සමිතිය , පාසල් ප්‍රජා කණ්ඩායම් , විද්‍යාපීඨ ආචාර්යවරුන් හා ගුරු සිසුන් හා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ ප්‍රාථමික අධ්‍යාපන ගුරු උපදේශක | විදුහල්පති පාසල් සංවර්ධන සමිතිය | ප්‍රාදේශීය ලේකම් හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත |
| | • ගිවිසුම් ප්‍රකාරව වැඩසටහන් ආරම්භ කිරීම | පාසල් සංවර්ධන සමිතිය , පාසල් ප්‍රජා කණ්ඩායම් , විද්‍යාපීඨ ආචාර්යවරුන් ගුරු සිසුන් හා ප්‍රාථමික අධ්‍යාපන ගුරු උපදේශක | විදුහල්පති, පාසල් සංවර්ධන සමිතිය , කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ | ප්‍රාදේශීය ලේකම් හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත |

| | | | | |
|---|---|---|---|---|
| | • පාසලේ ක්‍රියාත්මක වන සියළුම ක්‍රියාකාරකම් ඇතුළත් ලේඛනයක් සකස් කිරීම.පාසලේ සංවර්ධන කටයුතු සිදුවන කාලය තුළ රජයේ අරමුදල් වියදම් දැරීම ප්‍රජා දායකත්වය හා වෙනත් අරමුදල් හා ප්‍රදාන පිළිබඳව වාර්තා තබාගත යුතුය.විශේෂයෙන්ම ප්‍රතිලාභී දායකත්වය ශ්‍රමයෙන් ලැබෙන්නේ නම් ඒ සඳහා දෛනික පැමිණීමේ තොරතුරු හා ප්‍රතිලාභී දායකත්වය (ආහාර පාන ඇතුළුව)පිළිබඳව වෙන වෙනම සටහන් තබා ගත යුතුය. | විදුහල්පති , ප්‍රජා කණ්ඩායම, ප්‍රාථමික අධ්‍යාපන ගුරු උපදේශක | විදුහල්පති, පාසල් සංවර්ධන සමිතිය , කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ | ප්‍රාදේශීය ලේකම් හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත |
| | • සිදුවන ක්‍රියාකාරකම් පිළිබඳ (දින වකවානු සහිතව)සියලුම වාර්තා පවත්වා ගැනීම<br>උදා -ප්‍රජා සහභාගීත්වය<br><br>• පාසල් මට්ටමේ ප්‍රගති වාර්තා තබාගැනීම හා ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම | විදුහල්පති, , පාසල් සංවර්ධන සමිතිය , පාසල් ප්‍රජා කණ්ඩායම් , විද්‍යාපීඨ ආචාර්යවරුන් ,ගුරු සිසුන් හා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ , ප්‍රාථමික අධ්‍යාපන ගුරු උපදේශක | විදුහල්පති , පාසල් සංවර්ධන සමිතිය , කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ | ප්‍රාදේශීය ලේකම් හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත |
| 2013.04.29-2013.05.12 | • ක්‍රියාකාරකම් නියමිත ප්‍රමිතියට අනුකූලව ක්‍රියාත්මක බව තහවුරු කර ගැනීම සඳහා නියාමනය. | විදුහල්පති , පාසල් සංවර්ධන සමිතිය, පාසල් ප්‍රජා කණ්ඩායම් , විද්‍යාපීඨ ආචාර්යවරුන් ,ගුරු සිසුන් හා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ, ප්‍රාථමික අධ්‍යාපන ගුරු උපදේශක , කලාප ප්‍රාථමිකඅධ්‍යාපන/නි.අ.අ./ ස.අ.අ., සෞඛ්‍ය ප්‍රවර්ධන නිලධාරී | විදුහල්පති, පාසල් සංවර්ධන සමිතිය හා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ | ප්‍රාදේශීය ලේකම් හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත |
| | • පාසල් මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම පැවැත්වීම හා ප්‍රගති වාර්තා සකස් කිරීම. | විදුහල්පති, ,පාසල් සංවර්ධන සමිතිය, පාසල් ප්‍රජා කණ්ඩායම් ,විද්‍යාපීඨ ආචාර්යවරුන් ගුරු සිසුන් හා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ, ප්‍රාථමික අධ්‍යාපන ගුරු උපදේශක | විදුහල්පති , පාසල් සංවර්ධන සමිතිය ,කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ | ප්‍රාදේශීය ලේකම් හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත |
| 2013.05.13-2013.05.26 | • නිම කරන ලද ක්‍රියාකාරකම් සම්බන්ධ වාර්තා සකස් කිරීම හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ප්‍රගතිය ඉදිරිපත් කිරීම(අදාළ ඡායාරූප සමග) | විදුහල්පති ,පාසල් සංවර්ධන සමිතිය, පාසල් ප්‍රජා කණ්ඩායම්, විද්‍යාපීඨ ආචාර්යවරුන් හා ගුරු සිසුන් හා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ හා ප්‍රාථමික අධ්‍යාපන ගුරු උපදේශක | විදුහල්පති, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප ප්‍රාථමික අධ්‍යාපන නි.අ.අ./ස.අ.අ.. සෞඛ්‍ය ප්‍රවර්ධන නිලධාරී | ප්‍රදේශීය ලේකම් හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත |

| | | | | |
|---|---|---|---|---|
| 2013.05.27-<br>2013.06.05 | • ක්‍රියාකාරකම් නිමවීමෙන් පසුව ඒවා මැනවින් නඩත්තු කිරීම සඳහා ප්‍රජාව දැනුවත් කිරීම. | විදුහල්පති,පාසල් සංවර්ධන සමිතිය, පාසල් ප්‍රජා කණ්ඩායම්, විද්‍යාපීඨ ආචාර්යවරුන් හා ගුරු සිසුන්, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ හා ප්‍රාථමික අධ්‍යාපන ගුරු උපදේශක | විදුහල්පති, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප ප්‍රාථමික අධ්‍යාපන නි.අ.අ./ස.අ.අ., සෞඛ්‍ය ප්‍රවර්ධන නිලධාරි | ප්‍රදේශීය ලේකම් හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත |
| | • සියලු ම වැඩසටහන් නිම කිරීමෙන් පසු අවසන් ප්‍රගති වාර්තාව සකස් කිරීම හා සම්බන්ධීකරණ කමිටුවට ප්‍රගතිය ඉදිරිපත් කිරීම. | විදුහල්පති,පාසල් සංවර්ධන සමිතිය, පාසල් ප්‍රජා කණ්ඩායම්,විද්‍යාපීඨ ආචාර්යවරුන් හා ගුරු සිසුන්,කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ හා ප්‍රාථමික අධ්‍යාපන ගුරු උපදේශක | විදුහල්පති, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප ප්‍රාථමික අධ්‍යාපන නි.අ.අ./ස.අ.අ., සෞඛ්‍ය ප්‍රවර්ධන නිලධාරි | ප්‍රාදේශීය ලේකම් හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත |
| | • වැඩසටහන අගයමින් සමාප්තිය සනිටුහන් කිරීමේ විශේෂ අවස්ථාව | සහභාගී වූ සියලු පාර්ශවයන්ගේ සහභාගීත්වය | විදුහල්පති, කලාප ප්‍රාථමික අධ්‍යාපන නි.අ.අ./ස.අ.අ. | ප්‍රදේශීය ලේකම් හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත |